Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# නාඋල ප්‍රාදේශීය සභාව

නාඋල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් කර ඇති සෞඛ්‍ය කම්කරු III වන පන්තියේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති මධ්‍යම පළාතේ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III | 02 | රා.ප.ච. 03/2016 (II) අනුව PL1 - 2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 රු. 36,410 | 5 ශ්‍රේණිය සමත් |

*පොදු සුදුසුකම් :*

I. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත වියයුතුය;

II. අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය;

III. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය;

IV. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියේ වරදකරුවෙකු වී ඇති දඬුවම් ලැබූකෙ නොවිය යුතුය;

V. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය;

VI. නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළින් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමානව සුදුස්සන් තෝරා ගැනීමට නොහැකි වූ විටක යාබද පළාත් පාලන ආයතන බල ප්‍රදෙශයේ පදිංචිකරුවන්ගෙන් සුදුස්සන් තෝරාගනු ලැබේ.

ඉහත සඳහන් සියලුම තනතුරු සඳහා බඳවා ගැනීම නාඋල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. බඳවා ගනු ලබන සේවකයින් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

III. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලට, පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසි වලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/ පනත්වල විධානවලටද, නාඋල ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන ලද/ ලබන නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකග විය යුතුය.

03. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2018.09.14 වැනි දිනට පෙර ලේකම්, නාඋල ප්‍රාදේශීය සභාව, නාඋල යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළයුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ),

(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,

(v) අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

*සැ.යු.*- මෙම *ගැසට්* නිවේදනය සංශෝධනය කිරීම හෝ කල් දැමීම හෝ අවලංගු කිරීම යන සියලු බලතල නාඋල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ජී. එච්. එම්. උපුල් ප්‍රියදර්ශන,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
නාඋල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය කම්කරු III පන්තියේ තනතුරු සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම (මුලකුරු සමඟ) :——————————————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————————.

03. ස්ථිර ලිපිනය :——————————————.

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————.

05. දුරකථන අංකය :——————————————.

06. නාඋල ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :——————————————.

07. උපන් දිනය : වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.

08. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————

09. 2018.09.14 වැනි දිනට වයස : අවුරුදු :—————.

10. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.

11. විවාහක/අවිවාහක බව :——————————————.

12. ජාතිය :——————————————.

13. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? යන වග :——————————————.

14. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

අ.පො.ස./සා. පෙළ විභාගය :——————————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො. ස. උ/පෙළ විභාගය :————————————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

15. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් ඒව බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරු තෝරා ගැනීම පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවත් පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.